**- දැන්වීමයි -**

## දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

1.0 දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් **2025 නොවැම්බර්/ දෙසැම්බර්** මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.sp.gov.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2025 ඔක්තෝම්බර් මස 24** වැනි දින වේ.

**සටහන 01 :- මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2025 ඔක්තෝම්බර් මස 03** වැනි දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, **2025 ඔක්තෝම්බර් මස 24** වැනි දින ප.ව. 6.00 ට අවසන් වේ.

මෙම විභාගය ගාල්ල, මාතර හා තංගල්ල යන නගරවල පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. සියලු අයදුම්කරුවන් එම නගර අනුව විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තුවන නගරය ලෙස තෝරාගත යුත්තේ අයදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් නගරයක් පමණි. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය නිවැරදිව සඳහන් කළ යුතු ය. විභාගයට පෙනී සිටීමට තෝරාගන්නා ලද නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වූ විට විභාගය පවත්වනු ලබන නගර හෝ නගරය පිළිබඳ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්, දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 **(අ) සම්පූර්ණ කිරීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව 25 කි.**

(ආ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඇ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 291 හා 2018.12.31 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද දකුණු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කෘෂිකර්ම උපදේශක තනතුර සඳහා පනවා ඇති නියම හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි / දකුණු පළාත් මුදල් රීති විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර තුනක් (03) අනිවාර්යයෙන් ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියෙකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

(ඉ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ. කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඊ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව ඔබ විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ. තවද භාෂා ප්‍රවීනතාවය සම්බන්ධයෙන් බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධාන අදාළ වේ.

**4.0** **වැටුප :-** 2025.03.25 දිනැති හා අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN - 03 වැටුප් කේතයට මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ වැටුප් පරිමාණය 52,250 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 - 100,040/- වන අතර එම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**5.0** දකුණු පළාත් කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. මෙම විභාගයෙන් කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන්ට මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ.

**6.0** සුදුසුකම් :- . දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**6.1 අධ්‍යාපන සුදුසුකම් :-**

(අ). සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව. ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

සහ

(ආ). ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය/ විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත් ව තිබීම.

**සටහන 02:-** ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය සහ තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් ක්ෂේත්‍රයට අදාළ විෂයයන් ලෙස සැලකේ.

**6.2 වෘත්තීය සුදුසුකම් :-**

i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 (හය) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම,

හෝ

ii. කුණ්ඩසාලේ, අඟුණකොළපැලැස්ස, පැල්වෙහෙර, බිබිල, ලබුදූව, වාරියපොල, වව්නියාව, අනුරාධපුරය හා කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳව දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

iii. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

vi. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

v. රජය විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම,

හෝ

vi. ඉහත සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි ශ්‍රීලංකා තාක්ෂණ සේව මණ්ඩලය විසින් හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සටහන 03:-** ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් ඩිප්ලෝමාව ලබාගත් අය එම විශ්වවිද්‍යාලයේ එම ඩිප්ලෝමාවට අදාළ පදනම් පාඨමාලාව සමත්වී ඇත්නම් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**6.3 පළපුරුද්ද** :- අදාළ නොවේ

**6.4 වයස** :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට එනම් 2025.10.24 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2007.10.24 දිනට හෝ ඊට පෙර හා 1995.10.03 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**6.5 කායික සුදුසුකම්** :- සෑම අපේක්ෂකයෙකුම දකුණු පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, මනා සෞඛ්‍ය තත්ත්වයෙන් හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් ද යහපත් චරිතයකින් ද යුක්ත විය යුතු ය.

**6.6 වෙනත්** :-

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු අවසන් දිනට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ ඇය ඉල්ලුම් කරන දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03) වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටිය අයෙකු විය යුතු ය.

හෝ

විවාහය මත දකුණු පළාතට පදිංචිය වෙනස්වී ඇති අයදුම්කරුවෙකු නම්, විභාගය සඳහා සුදුසුකම් සම්පූර්ණ කළයුතු අවසන් දිනට පූර්වයෙන්, කලත්‍රයාගේ දකුණු පළාතේ පදිංචිය විවාහක දිනයේ සිට ලිත් වර්ෂ 03 ක් අතීතයට තිබිය යුතු ය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

v. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

**7.0 දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත තෝරා ගැනීම :-**

(අ) අයදුම්කරුවන් විසින් තමා පුරප්පාඩු සඳහා තරග කිරීමට තෝරාගනු ලබන දිස්ත්‍රික්කය මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී නිවැරදිව සඳහන් කළ යුතු ය.

(ආ) සේවයට බඳවා ගැනීම නියෝජනාත්මක පදනමක් මත කෙරෙනු ඇත. එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක ජන සංඛ්‍යාවට සමානුපාතිකව එම එක් එක් දිස්ත්‍රික්කය සඳහා පුරප්පාඩු සංඛ්‍යාවෙන් නියමිත ගණන වෙන් කරනු ලැබේ. යම් දිස්ත්‍රික්කයකින් පිරවිය යුතු පුරප්පාඩු සංඛ්‍යාව සඳහා තරග කිරීමට සුදුස්සන් වනුයේ එම දිස්ත්‍රික්කයෙන් ඉල්ලුම් කරන අයදුම්කරුවන් පමණි.

I. යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා අයදුම් කර සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් පිරවිය නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව යාබද දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදා හරිනු ලැබේ.

II. විභාගයේ දී අවශ්‍ය අවම ලකුණු ලබාගත් සංඛ්‍යාව වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩුවන විට දිස්ත්‍රික් ජන සංඛ්‍යා පදනම මත තෝරා ගැනීම සිදු නොකෙරේ.

**සැලකිය යුතු යි:-** දිස්ත්‍රික්කයට වෙන් කළ පුරප්පාඩු ගණන යන්නෙන් අදහස් වන්නේ එම පරිපාලන දිස්ත්‍රික්කයේ ජනගහනයට අනුපාතිකව එම දිස්ත්‍රික්කයෙන් තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා වෙන් කරන පුරප්පාඩු ප්‍රමාණය වන අතර එම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පවතින රාජ්‍ය ආයතනවල ඇති සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව නොවන බව සැලකිය යුතු වේ.

**සටහන 04** :- කිසිම අපේක්ෂකයෙකුට එක් දිස්ත්‍රික්කයකට වැඩි ගණනක පුරප්පාඩු සඳහා තරග කිරීමට අවසර දෙනු නොලැබේ. මාර්ගගත අයදුම්පත යොමු කිරීමේ දී ඉහත 7 හි සඳහන් සුදුසුකම් අනුව තමන් පුරප්පාඩු සඳහා තරග කිරීමට දිස්ත්‍රික්කය තෝරාගත් පසු එය නැවත වෙනස් කළ නොහැකි ය.

8.0 **විභාග පටිපාටිය :-** මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත් වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

| විෂයය | කාලය පැය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය (Intelligence Quotient Test) | පැය 01 යි | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය (Subjective Technical Paper) | පැය 02 යි | 100 | 40% |

8.1 **විභාගය සඳහා වන විෂය නිර්දේශ පහත පරිදි වේ.**

8.1 **(අ) බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවය, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත ය.

8.1 **(ආ) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය**

තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ

1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය
   1.1. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වයෙ
   1.2. රැකියා වියුක්තිය
   1.3. කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්ත්වය

2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම

3. පස හා ශාක පෝෂණය
   3.1. පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම
   3.2. ශාක පෝෂණය, පාංශු/ ශාක පෝෂණය කළමණාකරණය
   3.3. පැලෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

4. වී නිෂ්පාදනය
   4.1. පාංශු දේශගුණික අවශ්‍යතාවය
   4.2. ප්‍රභේද
   4.3. බිම් සකස් කිරීම හා තවාන් පාලනය
   4.4. පළිබෝධ හා රෝග මර්ධනය
   4.5. පොහොර යෙදීම
   4.6. ජල කළමණාකරණය/ අස්වනු වැඩි කර ගැනීමේ නූතන ක්‍රමවේදය
   4.7.අස්වනු නෙළීම හා පසු තාක්ෂණය
   4.8. බිත්තර වී නිෂ්පාදනය

5. වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය
   5.1. ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු, සහ වෙනත් භෝගවල ප්‍රභේද

6. එළවළු නිෂ්පාදනය
   6.1. එළවළු තවාන් පාලනය
   6.2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙලීම හා සැකසීම

7. පළතුරු
   7.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම

8. භෝග ආරක්ෂණය.
   8.1. භෝග වගාවට වැළදෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම ඒවායේ පාලන විධි
   8.2. වල් මර්ධනය, වල් මර්ධන ක්‍රම
   8.3. පළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම

9. පාංශු රසායන
   9.1. පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම

10. වාරිමාර්ග හා ජල කළමණාකරණය
   10.1. විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
   10.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම
   10.3 ජල වහනය හා එහි වැදගත්කම

11. ගොවිපල් යාන්ත්‍රිකරණය
   11.1. ගොවිපල් යාන්ත්‍රිකරණයේ වාසි අවාසි
   11.2. බිම් සකස් කිරීමට භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   11.3. ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිතා කරන කෘෂි යන්ත්‍රෝපකරණ
   11.4. ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව

12. මී මැසි පාලනය
   12.1. ආර්ථික වැදගත්කම
   12.2. මී මැසි ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම
   12.3. අස්වනු ලබා ගැනීම හා වෙළඳ පොළට සකස් කිරීම

13. මල් වගාව හා භූමි අලංකරණය
   13.1. ආර්ථික වැදගත්කම
   13.2. භූමි අලංකරණ ක්‍රම
   13.3.වෙළඳ පොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳ පොළට සකස් කිරීම

**14.** ආරක්ෂිත ගෘහතුළ භෝග වගාව

14.1. වැදගත්කම

14.2. සැලසුම් කිරීම

14.3. භෝග තෝරා ගැනීම, ජලය/ පොහොර යෙදීම

14.4. පවත්වා ගෙන යාම හා අස්වනු සකස් කිරීම

**15.** සත්ත්ව පාලනය

15.1. කුකුළු පාලනය හා කිරි ගව පාලනය

15.2. සමෝධාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ත්ව නිෂ්පාදන පවත්වා ගැනීම

**16.** කෘෂිකාර්මික ව්‍යාප්තිය

16.1. කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය

16.2. කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම

**17.** පටක රෝපණය

17.1. පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම

17.2. පටක රෝපණයේ භාවිතයන්/ යෙදීම්

17.3.පටක රෝපණයේ වාසි අවාසි

**18.** පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම

18.1. පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම

18.2. පැළෑටි නිරෝධායන ක්‍රම

**19.** ශාක සංරක්ෂණය

19.1. ශාක සංරක්ෂණයේ වැදගත්කම(ශාඛ/ ජාන ප්ලාස්ම)

19.2 ශාක සංරක්ෂණ ක්‍රම (ශාඛ/ ජාන ප්ලාස්ම)

20. ජෛව තාක්ෂණය

20.1. DNA වල වැදගත්කම

20.2. ජානය යනු කවරක්ද, එහි ක්‍රියාකාරීත්වය

20.3. ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මඟින් ශාක වැඩිදියුණු කිරීමට ඇති හැකියාව

**21.** කෘෂි ව්‍යවසායකත්වය

21.1 අලෙවිකරණ දැනුම

21.2 අගය එකතු කළ නිෂ්පාදන

21.3 කෘෂි නිෂ්පාදනයන්හි අගයදාම සංවර්ධනය

21.4 කෘෂි නිෂ්පාදනයන්හි මිල තීරණය

**22.** කාබනික වගාව

22.1 වැදගත්කම

22.2 වාසි/ අවාසි

**23.** සහතික කරණය

23.1 GAP

23.2 GMP

23.3 HACCP

23.4 Organic Certificate

**24.** ආහාර තාක්ෂණය

24.1 ආහාර සැකසීමේ තාක්ෂණ ක්‍රමවේද
24.2 ලේබලයක ඇතුළත් විය යුතු කරුණු
24.3 නවීන ඇසුරුම්කරණ ක්‍රමවේද හා එහි වාසි

**25.** කෘෂිකර්ම සංවර්ධනය

වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්යය භාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට අධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්.

**9.0** **විභාග ප්‍රතිඵල** :- දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** මඟින් එක් එක් අයදුම්කරුට පෞද්ගලිකව භාගත කර ගැනීමට හැකිවන පරිදි විභාග ප්‍රතිඵල නිකුත් කරනු ලබන අතර, විභාගය සමත් අයදුම්කරුවන්ගේ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල අනුව සකස් කරන ලද නාම ලේඛනයක් පත්වීම් බලධරයා වෙත නිකුත් කරනු ලැබේ.

**10.0** **විභාග ගාස්තු :-** විභාග ගාස්තුව රු. 1,000/- කි. මාර්ගගත ව (Online) විභාග ගාස්තු ගෙවිය යුතු වේ. සියලුම ගෙවීම් සිදුකළ යුත්තේ **VISA හෝ MASTER** කාඩ්පත් මඟින් පමණක් වන අතර, ඒ හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිදු ආකාරයකින් පිළිගනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තුවට වඩා අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැළකිය යුතු ය.

**සටහන 05 :-** අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරුවන් විසින් විඳ දරාගත යුතු ය.

**11.0 අයදුම්කළ යුතු පිළිවෙල :-**

සියලුම අයදුම්කරුවන් **www.psc.sp.gov.lk** යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස විභාගය නිවැරදි ව තෝරා, අදාළ තොරතුරු ඇතුළත් කර විභාග ගාස්තු ගෙවීමෙන් පසු අයදුම්පත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කළ යුතු ව ඇත. මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ කාල සීමාව **2025 ඔක්තෝම්බර් මස 24 වන දින ප.ව. 6.00** න් අවසන් වේ. (මේ සඳහා අන්තර්ජාල පහසුකම් සහිත Desktop හෝ Laptop පරිගණකයක් භාවිත කිරීම වඩාත් සුදුසු වේ.)

11.1 අයදුම්කරු විසින් ම මෙම විභාගය සඳහා තම අයදුම්පත්‍රය මාර්ගගතව සම්පූර්ණ කළ යුතු ය.

11.2 අයදුම්කරුවන් විසින් ඇතුළත් කරනු ලබන කිසිදු තොරතුරක් පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එබැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු (Submit) කිරීමට පෙර එම තොරතුරු හොඳින් පරීක්ෂා කිරීම වැදගත් වනු ඇත.

11.3 වෙනත් ක්‍රම මගින් ඉදිරිපත් කරන අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. මාර්ගගතව මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ දී වැරදි විභාගයක් තේරීම වැනි අතපසුවීම් වලින් සිදුවන පාඩුව ඔබ විසින් විඳදරා ගත යුතු වේ.

11.4 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මාර්ගගතව යොමු (Submit) කරන ලද අයදුම්පත බාගත (Download) කර එහි දෘඩ පිටපත (Hard Copy) 2025 **ඔක්තෝම්බර් මස 24** දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වන අතර, ඒ සමඟ කිසිදු ඇමුණුමක් නොඑවිය යුතු ය. එම දෘඪ පිටපත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **දකුණු පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025** " යන්න සඳහන් කිරීම අනිවාර්යය වේ.

**ලේකම්,**
**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**6 වන මහල ,දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,**
**ගාල්ල.**

11.5 **අයදුම්පතෙහි අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන බාගත කර ගන්නා ලද අයදුම්පතෙහි දෘඩ පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මගින් ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ මගින් සහතික කරවා ගත යුතු ය.

12.0 **ප්‍රවේශ පත්‍ර :-**

මාර්ගගතව අයදුම්පත් කැඳවන බැවින්, සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත් මාර්ගගත ව ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට මෙම විවෘත තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිල වෙබ් අඩවිය වන **www.psc.sp.gov.lk** ඔස්සේ මාර්ගගත ව ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඒ අනුව වෙබ් අඩවියේ ඇති විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුව වෙත පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකි ය.

ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් අදාළ තීරුවෙහි සංශෝධනය වියයුතු ආකාරය නිවැරදිව සඳහන් කර අයදුම්කරුගේ අත්සන යෙදිය යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය. බාගත කර ගන්නා ලද විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිත කරමින් මුද්‍රණය කර අත්සන සහතික කරවා ගෙන විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු මගින් ද එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රජයේ හෝ

පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ මඟින් සහතික කරවා ගත යුතු ය.

13.0 **විභාගයට ඇතුළත් කර ගැනීම:-**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන් ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතු ය.

14.0 **අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :-**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

15.0 **තෝරා ගැනීමේ ක්‍රමය :-** මෙම තනතුරු සඳහා විභාගයෙන් දක්වන ලද කුසලතාවය හා දිස්ත්‍රික් ජනගහන අනුපාතයට අනුව සිදුකරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් (ලකුණු ලබාදෙනු නොලැබේ) පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ. (පත්වීම් ප්‍රදානයේ දී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දියයුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවක දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා අධ්‍යාපන සුදුසුකම් අනුව ඉහළම සුදුසුකම් ඇති පුද්ගලයන් අනුපිළිවෙලින් තෝරා ගැනේ.)

16.0 **සාවද්‍ය තොරතුරු සැපයීම :-** මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. තව ද, කිසියම් අපේක්ෂකයෙකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

i. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට මෙම කොමිෂන් සභාවට බලය ඇත.

ii. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ ඇයට පත්වීමක්

ලබාදීම සම්බන්ධයෙන් තවදුරටත් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතු කොට ගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

17.0 විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

18.0 විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට ආනුෂංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

19.0 මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සී.පී. රාජකරුණා**
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සී.පී. රාජකරුණා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
දකුණු පළාත

2025 ඔක්තෝම්බර් 03 දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

(මෙම දැන්වීම පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස් කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කිසිදු වගකීමක් දරනු නොලැබේ.)